# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2355/12 - 2023 ඔක්තෝබර් මස 23 වැනි සඳුදා - 2023.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2014 (II)

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වැනි වගන්තිය යටතේ මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහජන ආරක්ෂක අමාත්‍ය.

2023 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2017 මැයි මස 31 වන දින අංක 2021/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග අංක 1 පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 20 වන නියෝගයේ (2) වන අනු නියෝගය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබීමෙන් :-

"(2) (අ) පනතේ 39ආ වගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරනු ලබන, ජාතික හැඳුනුම්පතක සහතික පිටපතක් සඳහා ගාස්තුව රුපියල් එක් දහසක් විය යුතු ය; සහ

(ආ) පනතේ 39ආ වගන්තියේ (ඇ) ඡේදය යටතේ ජාතික හැඳුනුම්පතක් පිළිබඳ විස්තරවල සත්‍යතාවය සහතික කිරීම සඳහා වූ ගාස්තුව -

(i) ඒ සඳහා වන ඉල්ලීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මාර්ගගත ක්‍රමවේදය හරහා ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, රුපියල් විසි පහක්; සහ


1A - G 40579 — 07 (2023/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) ඒ සඳහා වන ඉල්ලීම, භෞතික ලේඛනයක් මගින් හෝ කොමසාරිස් ජනරාල්වරයා හට පිළිගත හැකි ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදයක් හරහා ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, රුපියල් පන්සියයක්;

විය යුතුය. ”

(2) එහි 25 වන නියෝගයේ -

(අ) (1) වන අනු නියෝගයේ "රුපියල් දසදහසක්" යන වචන වෙනුවට "රුපියල් පහළොස් දහසක්" යන වචන ආදේශ කරනු ලැබීමෙන්; සහ

(ආ) එහි (2) වන අනු නියෝගය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබීමෙන් -

"(2) ලියාපදිංචි සහතිකය නැවත අලුත් කිරීම සඳහා ගාස්තුව රුපියල් තුන් දහසක් විය යුතු ය".

මේ නියෝගවල -

"පනත" යන්නෙන් 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත අදහස් වේ;

"කොමසාරිස්-ජනරාල්වරයා" යන්නෙන්, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පත් කරන ලද පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ.

EOG 10 - 0229

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.